# ශ්‍රී ලංකාවේ බ්‍රතාන්‍ය පාලනය රැ මුරකරුවාගේ ස්වභාවයක් ඉසුළුවේද ?

ශාස්ත්‍රපති අජිත් තල්වත්ත
(බී.ඒ. එම්.ඒ. පේරාදෙණිය)

ඉතිහාසකරණ ක්‍රියාවලියේදී ඉතා වැදගත් මතවාදයක් ලෙස "යටත්විජිත රාජ්‍ය" යන සංකල්පය පෙන්වාදිය හැකිවේ. මෙම අධ්‍යයනය සිදුකිරීමේදී යටත්විජිත රාජ්‍ය යන සංකල්පය ප්‍රථමයෙන් හඳුනාගෙන ඉන්පසු එය ශ්‍රී ලංකාවේ පාලනය සම්බන්ධයෙන් කෙබඳු ආකාරයකට වැදගත් වන්නේද යන්න විමසා බැලිය යුතුවේ.

යටත්විජිත රාජ්‍ය යන සංකල්පය හඳුනාගැනීමේදී එය ප්‍රථමයෙන් ජනිත වූයේ යුරෝපය කේන්ද්‍ර කර ගනිමිනි. නමුත් යුරෝපීය සභ්‍යත්වයට පෙර මෙම සංකල්පය ඈත ග්‍රීක, රෝම අවධියේ පටන් පැවති බව පෙනේ. එනමුත් මෙය වඩා කේන්ද්‍රව විකාශනය වන්නේ යුරෝපීය කේන්ද්‍රතාවාදය මුල්කරගෙන බව පෙනේ. විවිධ ජන කොටස් වල බලය පෙරටු කොටගෙන ලෝකයේ නොයෙක් ප්‍රදේශයන්හි යටත්විජිත රාජ්‍ය දක්නට ලැබුණද ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරන්නේ බ්‍රිතාන්‍ය පාලනය සම්බන්ධයෙන් එය කෙසේ ක්‍රියාත්මක වූවාද යන්න විමසා බැලීමටයි. ලංකා යටත්විජිත වාද ඉතිහාසකරණයේ දක්නට ලැබෙන ප්‍රධාන සංවාදයක් වන්නේ බ්‍රිතාන්‍ය යටත්විජිත රාජ්‍ය මුරකරුවකුගේ ස්වභාය ගත් එකක් බවට තර්කයක් ඉදිරිපත්වේ. මෙය ලංකාව සම්බන්ධයෙන් කෙබඳු ආකාරයට බලපැවැත්වූයේද යන්න හඳුනාගැනීමට පෙර, යුරෝපය කේන්ද්‍ර කරගෙන ගොඩනැගි පළල් ආකාරයට විකාශනය වූයේ කෙසේදැයි අවධානය යොමු කිරීම යෝග්‍ය වේ.

යටත්විජිත රාජ්‍ය යන සංකල්පය හඳුනාගැනීමේ ඒ පිළිබඳ යම් අවබෝධයක් ලබාගැනීම වැදගත්වේ. එයට හේතුව වන්නේ යටත්විජිතවාදය කේන්ද්‍ර කරගනිමින් යටත් රාජ්‍ය යන්න වර්ධනය වන බව දක්නට ලැබේ. ඉංග්‍රීසි විශ්ව කෝෂයට අනුව යටත්විජිතවාදය යනුවෙන් අදහස් කරනු ලබන්නේ විවිධ වූ යුරෝපා ජාතීන් විසින් ලෝකයේ මහා පරිමාණ වශයෙන් ප්‍රදේශ සොයා ගැනීමටත්, අල්ලා ගැනීමටත්, ස්ථාපනය කිරීමටත්, එයින් ලාභ ප්‍රයෝජන ගැනීමටත්, ගෙනගිය ආර්ථික හා දේශපාලන ක්‍රියාවලියක් බව

පෙන්වා දී ඇත. එසේම ඇතැම් විද්වතුන් විසින් යටත්විජිතවාදය නිර්වචනය කරන්නේ මව් රාජ්‍යයන් විසින් යටත් ප්‍රදේශ පවත්වාගෙන ගිය ක්‍රියාවලියක් හෝ පාලන රාජ්‍ය හා යටත්විජිත ජනයා අතර පැවති සබඳතාවය මේ නමින් හඳුන්වයි. කොන්සවේටිව්වාදීන්ට අනුව යටත්විජිතවාදය යනු අමුද්‍රව්‍ය, වෙළඳපොල හා මව් රටේ විශිෂ්ටත්වය අවධාරණය කරගැනීමට මහෝපකාරී වන සංකල්පයකි. තවද ලිබරල් වාදීන්ගේ අදහස එතරම් දැඩි නොවන අදහසකි. එනම් ස්වකීය අමුද්‍රව්‍ය ඉතා වැඩි මිලකට ඉල්ලන තැනට විකිණීමත් ස්වකීය අවශ්‍යතා ඉතා අඩුමිලකට ලැබිය හැකි තැනකින් ලබාගැනීමටත් හැකි න්‍යායාත්මක සංකල්පයක් බව පෙන්වාදී ඇත. මෙම යටත්විජිතවාදය හඳුනාගැනීමේදී සමාජවාදීන් විසින් පෙන්වා දී ඇති මතවාදයද ඉතා වැදගත්වේ. ඔවුන් දකින ආකාරයට යටත්විජිතවාදය යනු සූරාකෑමේ උපක්‍රමයකි. ලෙනින් විසින් යටත්විජිතවාදය හැඳින්වූයේ ප්‍රදේශ ඒකාධිකාරය හා මූල්‍ය ප්‍රාග්ධන පාලනයෙහි ප්‍රථම අවස්ථාව ලෙසයි. එසේම කොන්සවේටිව්වාදී ඩිස්රෙයලි විසින් පෙන්වා දෙන්නේ යටත්විජිත වූ කලී අප ගෙල බැඳගත් ඇඹරුම් ගලක් වැනි කාලකන්නි දෙයක් බවයි. සර් වින්සන්ට් චර්චිල්ගේ විග්‍රහය වන්නේ යටත්විජිතවාදය වූ කලී මව් රටෙහි කර්මාන්ත ස්වකීය භාණ්ඩ නිපදවීමට අවශ්‍ය අමුද්‍රව්‍ය සපයන මාර්ගයක් ලෙස යටත්විජිතවාදය පෙන්වා දී තිබේ. මෙලෙස ඒ ඒ දේශපාලන සන්දර්භය තුළ විද්වතුන් විසින් යටත්විජිතවාදය සම්බන්ධයෙන් ගෙනහැර ඇති විග්‍රහයන් ඉහතින් පැහැදිලිවේ.

ක්‍රි.ව. 1500 දී පමණ යටත්විජිතවාදය ආරම්භවේ. දේශගවේෂණ ව්‍යාපාර ව්‍යාප්ත වී ක්‍රි.ව. 1488 දී අප්‍රිකාවේ දකුණු වෙරළ හරහා නව මුහුදු මාර්ග සොයා ගැනීමත්, ක්‍රි.ව. 1492 ඇමරිකාව සොයාගැනීමත්, යුරෝපයේ ජාතික රාජ්‍ය වර්ධනය වීමත් සමග බොහෝ අත්ලාන්තික් යුරෝපීය රටවල් දේශගවේෂණ සහ යටත්විජිත පිහිටුවීමට යොමුවිය. විශේෂයෙන්ම පෘතුගාලය, ඕලන්දය, ස්පාඤ්ඤය, ප්‍රංශය, එංගලන්තය යන රටවල් පෙරමුණ ගත්තේය. බටහිර ජාතීන් විවිධ ප්‍රදේශ කේන්ද්‍ර කරගනිමින් යටත්විජිත ආරම්භ කිරීමත් සමග යටත්විජිතවාදය වෙනුවෙන් සුවිශේෂී කාර්ය භාරයක් ඉටු කළේ බ්‍රිතාන්‍ය ජාතිකයන්ය. 19වන සියවස වනවිට සෙසු යුරෝපා ජාතීන් අභිබවා ඉංග්‍රීසින්

පෙරට පැමිණ යටත්විජිත පාලනය කළ ආකාරය විමසා බැලිය යුතුය.

ඉහතින් සඳහන් කළ පරිදි යටත්විජිත රාජ්‍ය යන සංකල්පය ලංකාවේ පාලනය කෙරෙහි යොදාගනු ලැබුවේ රැමුරකරුවකුගේ කාර්යක් ලෙස, යොදාගත් බවට යටත්විජිතවාදය සාධාරණීය කරණය කිරීම සඳහා යොදාගෙන ඇත. මෙම මතවාදය ලංකාව කෙරෙහි බලපෑ ආකාරය විමසා බැලීමට පෙර සමස්ථ යටත්විජිත රාජ්‍ය ක්‍රමය තුළ කවර පදනමක් මත එය ස්ථාපිත කිරීමට මව් රාජ්‍ය අනුගමනය කළ පිළිවෙත හඳුනාගත යුතුය. මව් රාජ්‍ය යටත්විජිත අල්ලා ගැනීම කරන ලද්දේ සුපිරි ආර්ථික පදනමක් මත පිහිටා එහි බලපෑම් යොදා ගනිමින් හෝ යුධ ශක්තිය මගින් බලවත් දේශපාලන ක්‍රමයක් අනුගමනය කිරීමෙනි. මෙසේ අල්ලාගත් යටත්විජිතවල ගෙනගිය ප්‍රතිපත්තිය වූයේ පළමුව ආගම ප්‍රචාරයත් දෙවනුව වෙළඳ කටයුතු සහ යුධ උපකරණ අලෙවි කිරීමයි. ආගමික මතවාද ප්‍රචාරය තුළින් යටත්විජිත වැසියන් තුළ ධනවාදයට හිතකර චින්තනමය රටාවක් ඇති කළේය. මාටින් ලූතර්ගේ ආගමික ව්‍යාපාරය සමග කතෝලික පල්ලියේ බල ඒකාධිකාරය බිඳවැටුනු අතර එහි ප්‍රතිඵලයක් ලෙස ජාතික රාජ්‍ය ක්‍රමය තුළ ධනවාදී ව්‍යවසායක පන්තියක් බිහිවිය. මෙම ක්‍රමය විකාශනය වීමේ ප්‍රතිඵලයක් ලෙස යුරෝපයේ මෙන්ම යටත්විජිතයන්හි ධනවාදී ආර්ථික ක්‍රමයක් ඇතිවිය. ධනය රැස්කිරීම අධෛර්යට පත් කරවන සුළු සම්ප්‍රදායික ආගම් වලින් ජනයා මුලුමනින්ම විමුක්ති මාර්ගයට උත්සහ කළහ. ධනවත් වීම දෙවියන් වහන්සේට කරන පූජාවකි. වෙළඳාමෙන් සාර්ථක වීම යන්න දෙවියන් වහන්සේ ස්වර්ගයට තෝරාගත් බවට සලකුණකි. යනාදී මතවාද යටත්විජිත වල ප්‍රචාරය කරන ලදි. මේ ආකාරයට යටත්විජිත ක්‍රමය තුළ මෙවැන ප්‍රතිපත්ති පදනම් කරගෙන දේශපාලන, ආර්ථික ක්‍රමයක් ක්‍රියාත්මක කළේය. අප මෙහිදී ප්‍රධාන වශයෙන් හඳුනාගත යුතු වන්නේ යටත්විජිත රාජ්‍ය යන සංකල්පය තුළ ලංකාවේ බ්‍රිතාන්‍ය පාලනය හැසිරවීමේදී, දේශපාලන සහ ආර්ථික කටයුතු ක්‍රියාත්මක කිරීම පිණිස කුමන පිළිවෙතක් භාවිතා කලේද යන්නයි.

යටත්විජිත රාජ්‍ය යන සංකල්පය විග්‍රහ කර බැලීමේදී බ්‍රිතාන්‍ය පාලනය තුළ ලංකාවේ බලය ස්ථාපිත කිරීමේ දී ඉතා වැදගත් සාධකයක් වූයේ ආර්ථිකයයි. ලංකාවේ යටත්විජිත ආර්ථිකයක් ගොඩනැගීමේ මූලික ක්‍රියාවලිය සිදුකරනු ලබන්නේ නැගෙනහිර ඉන්දීය වෙළඳ සමාගමයි. 1796 මෙරට බලය

පිහිටුවීමෙන් අනතුරුව ලංකාවේ පාලන කටයුතු බ්‍රිතාන්‍ය මව් රජය විසින් සහ ආර්ථික කටයුතු සමාගම විසින් සිදුකළ නිසා එය ද්විත්ව පාලන ක්‍රමයක් ලෙස හඳුන්වයි. එවැනි තත්වයක් තුළ යටත්විජිත රාජ්‍ය ගොඩනැගීමේදී වෙළඳ සමාගමට හිමිවන්නේ වැදගත් කාර්ය භාරයකි. කේ. එම්. ද සිල්වා පෙන්වා දෙන ආකාරයට ලංකාව ලිබරල්වාදී රාජ්‍යයක් බවත් රජය ආර්ථිකයට මැදිහත්වීම ඉන්දියාවට වඩා අත්‍යාවශ්‍ය යන මතය පිළිගෙන තිබුණි. යටත්විජිත රාජ්‍යයේ මූලික වගකීම වන්නේ ආර්ථික වර්ධනයට පවතින මූලික බාධාවන් ඉවත් කිරීමයි. එනිසා 1833 කෝල්බෲක් කොමිසම යටතේ රාජකාරිය සේවාව අහෝසි කිරීම, වෙළඳ ඒකාධිකාරය අහෝසි කිරීම වැනි කාර්යයන් ක්‍රියාත්මක කළේය. මෙහිදී සිදුවූයේ මෙතෙක් ඉඩමට ආර්ථික වටිනාකමක් නොලැබුණද එය ක්‍රමවත් නීත්‍යානුකූල අයිතිය තහවුරු වීම සඳහා යොමුකරන ලදි. එවිට ප්‍රධාන වශයෙන් ලංකාවේ වතු මිලදීගෙන වැවිලිකරුවන්ට වගා කිරීම සඳහා අවශ්‍ය ඉඩ ප්‍රස්ථාව උදාවිය. ඒ තුළින් ලංකාවේ ධනේශ්වර වෙළඳපොල ආර්ථිකයක් ගොඩනැගීමට අවශ්‍ය පදනම සකස් විය. මෙම වකවානුවේ ලංකාවට පැමිණි කෝල්බෲක් කැමරන් විසින් ප්‍රධාන වශයෙන් පෙන්වා දුන් මතයක්වූයේ ලංකාවේ ආර්ථික කටයුතු වලින් හැකිතරම් ඉවත්විය යුතුය යන මතය ප්‍රචලිත කළේය. එහි ප්‍රතිඵලයක් ලෙස ලුණු, මාළු, කුරුඳු ඒකාධිකාරය අහෝසි කිරීමෙන් මෙම ආර්ථික වර්ධනය අවශ්‍ය පසුතලය නිර්මාණය කරන ලදි. මෙම පසුබිම තුළ යටත්විජිත රාජ්‍ය ආර්ථිකයට මැදිහත් නොවිය යුතු අතරම මංමාවත් ඉදිකිරීමට සහ පුද්ගලික අයිතිය ලබාදීමේ නීතිපද්ධතියක් ද සකසක ලදි.

මෙම මතවාදය ගැන බටහිර ඉතිහාසඥයින් විසින් යටත්විජිතවාදය සාධාරණියකරණය කිරීමේදී රැමුරකරුවාගේ රාජ්‍ය නිර්බාධවාදී න්‍යාය යටතේ බිහිවන රජයක් සේ පෙන්වා දේ. මෙම සංකල්පය හඳුනාගැනීමේ වැදගත්වන කරුණු දෙකක් ඇත.

1. රජය සහ රාජ්‍ය යන සංකල්ප අතර ඇති වෙනස ප්‍රමාණාත්මක ලෙස නොසලකා හැරීම.
2. යටත්විජිතවාදය පිළිබඳ වඩා ස්ථාපිත න්‍යායාත්මක අදහසක් නොතිබීම යනුවෙනි.

මෙහිදී අප හඳුනාගත යුතුවන්නේ රජය සහ රාජ්‍ය අතර වෙනස නොසලකා හැරීම අතර විශාල පරතරයකි පවතී. කේ. එම්. ද සිල්වා පවසන්නේ

මේ තුළ පැහැදිලි පරතරයක් ඇති බවයි. රාජ්‍ය හඳුන්වන්නේ යටත්විජිත ක්‍රමය තුළින් බ්‍රිතාන්‍ය ධනේෂ්වර පන්තිය ස්තාපිථ කරන ලද බල ව්‍යුහයේ එක් අංගයක් පමණී යන මතය පෙන්වයි. මෙම අවස්ථාවේදී අපට පෙනීයන කරුණක් වන්නේ රාජ්‍ය යන සංකල්පයේ ජනතාව හුදු මිනිසුන් ලෙස සලකන ලදි. ඒ අනුව යටත්විජිතවාදයේ වර්ගවාදී ආකල්පයන් ගැබ්විය. සුදුහම සහිත මව් රාජ්‍ය ජනයා යටත්විජිතවාදය දෙස බැලුවේ ම්ලේච්ඡ ගති පැවතුම් සහිත පසුගාමී සංස්කෘතික නියෝජනයක් ලෙසය. මෙම න්‍යායට විරුද්ධව එල්ලවූ නියම විවේචනය දක්නට ලැබෙන්නේ නව මාක්ස්වාදීන්ගේ ඌන සංවර්ධන න්‍යාය තුළයි. මෙම නව මාක්ස්වාදීන්ගේ ඌන සංවර්ධන න්‍යාය තදින්ම ඉදිරිපත් කළේ එස්. බී. ද සිල්වා සහ අශෝක බණ්ඩාරගේ යන අය විසිනි. ඔවුන් දෙදෙනාගේ මතවාදය තුළින් පැහැදිළි වන්නේ යටත්විජිත රාජ්‍ය තීරණාත්මක ලෙස ලංකාවේ ආර්ථිකයට මැදිහත් වූ බවයි. ඒ තුළින් ගම්‍ය වන්නේ රජය විසින් ආර්ථිකය ප්‍රතිව්‍යුහගත කිරීමකි.

මෙම සංවාදය ක්‍රියාත්මක වීමේදී යටත්විජිත රාජ්‍ය ආර්ථිකයට මැදිහත් නොවිය යුතුය යන්න වෙනුවට තීරණාත්මකව මැදිහත්වූවාය යන මතවාදය පැන නැගුනි. එනම් දේශීය සමාජයේ සාම්ප්‍රදායික ලෙස වර්ධනය වූ ආර්ථිකයක් මත ස්ථාපිත වූ සමාජයක් හා සංස්කෘතියක් දක්නට ලැබේ. ලංකා සමාජය 1833 ට පෙර ප්‍රධාන වශයෙන් පැවතුනේ සාම්ප්‍රදායික අවශ්‍යතා මත පදනම් වූ සමාජ ක්‍රමයකි. එනිසා දේශීය සමාජයේ අවශ්‍යතා සීමිත වූ අතර සරළ ආර්ථිකයක් ක්‍රියාත්මක විය. මෙම වකවානුවේ සමාජයන්හි වැඩවසම් ක්‍රමය නිෂ්පාදන මාධ්‍යක් ලෙසත්, සමාජ සකස්වීමක් ලෙසත් ස්ථාපිත වී තිබුණි. ආර්ථික සාධකය යන්න දේශපාලන සබඳතා පමණක් නොව සමාජ සබඳතා බැඳ තැබූ රැහැනක් බවට පත්විය. එනිසා එය පෙරලාගෙන යෑම ප්‍රායෝගිකව කළ නොහැකි යන්න කෝල්බෲක් විසින් තවදුරටත් ගම්සභා ක්‍රමය පවත්වාගෙන යාමට අනුමැතිය දීමෙන් පැහැදිලිවේ.

යටත්විජිත රාජ්‍යයේ ස්වභාවය තීරණය කරන්නේ මව්රටේ ධනේශ්වර පන්තියයි. එයට ප්‍රධාන හේතුව වූයේ දේශපාලන, ආර්ථික බලය සහ බ්‍රිතාන්‍ය රජ්‍ය බලය තිබුණේ ධනේශ්වර පන්තියටයි. එය වඩාත් පැහැදිලි වන අවස්ථාවක් ලෙස හෙන්රි ඩන්ඩාස්ගේ නිර්දේශවල අරමුණ වූයේ මෙරට ආර්ථිකය පාලනය කර ප්‍රමාණාත්මක ආදායමක් ලබා ගැනීමය. මෙම නිර්දේශ

ඒකරාශීව ධනේශ්වර කොටස්වල අරමුණු සමග ප්‍රබල ලෙස ක්‍රියාත්මක විය. එනිසා ධනේශ්වර පන්තිය යටත්විජිත රාජ්‍යයේ වැදගත් පිරිසක් බවට පත්වූහ. මෙම අවධියේ මව් රාජ්‍යයේ සිටි ධනේශ්වර පන්තිය ගැන බලන විට දේශපාලන බලය හෝ රාජ්‍ය බලය හිමිකරගෙන සිටි පන්තියක් ලෙස හැඳින්වුවත්, ඔවුන් පැහැදිලි ලෙසම වර්ධනය වූ පන්තියක් නොව සංකීර්ණ මතවාදයන් පෙරටු කොටගෙන ක්‍රියාත්මකවූ පිරිසක් බව පෙනේ. මෙයින් අවබෝධ වන්නේ යටත්විජිත රාජ්‍යයේ බලය තිබුණේ වාණිජ වශයෙන් බලවත් පන්තියටයි.

ඉහතින් පෙන්වාදුන් ආකාරයට බ්‍රිතාන්‍යයෙන් ලංකාවේ බලය ස්ථාපික කිරීමේදී ප්‍රබල කොටස බවට පත්විය. යටත්විජිතවාදය තුළින් ආර්ථික ප්‍රයෝජන ලබාගන්නේ කෙසේද යන්න පිළිබඳ මතවාද තිබුණි. මෙම මතවාදය ගොඩනැගෙන විට ඇඩම් ස්මිත් වැනි අය ඉදිරිපත් කළ අදහස් ඉතා වැදගත්වේ. මාක්ස්වාදී න්‍යායට අනුව එක් ආර්ථිකයක් බිඳවැටී නව ආර්ථිකයක් ගොඩනැංවිය නොහැකිය. මෙම තත්වය එංගලන්තයේ දක්නට ලැබුණි. එනම් රදළ ක්‍රමය යටපත් වී ධනේශවර ක්‍රමය බිහිවිය. එනම් මෙතෙක් කල් ක්‍රියාත්මක වූ වාණිජවාදී ආර්ථික රාමුව බිඳවැටී ධනේශ්වර ආර්ථික රාමුවක් ස්ථාපිත විය. ලංකාවේ යටත්විජිත රාජ්‍ය ගොඩනැගීමේදී මුලින් පෙන්වාදුන් ලෙස ලංකා යටත්විජිත රාජ්‍ය ගොඩනැගෙන්නේ නැගෙනහිර ඉන්දීය වෙළඳ සමාගම යටතේය. එය වඩාත් පැහැදිලි වන්නේ බ්‍රිතාන්‍ය රජය විසින් ඉදිරිපත් කරන ලද හෙන්රි ඩන්ඩාස්ගේ නිර්දේශ වල අරමුණ වූයේ මෙරට ආර්ථිකය පාලනය කර ප්‍රමාණාත්මක ආර්ථික සංවර්ධනයක් ඇති කිරීමයි. නමුත් එය ලංකාවේ ක්‍රියාත්මක කිරීමේදී ලේඛන වල සඳහන් නොවේ. මව් රාජ්‍යයේ ප්‍රයෝජනයත්, ජනතාවගේ සුභසාධනයත් යන අදහස ඔවුන් විසින් පෙන්වාදී ඇත. එහෙත් මෙහි දක්නට ඇත්තේ වාණිජ ධනේශ්වර පන්තිය වඩා ප්‍රබලව ආරක්ෂා කිරීමේ අරමුණින් ලන්දේසි අවධියේ පැවති කුරුඳු, මුතු, ලුණු, මාළු වැනි ඒකාධිකාරයන් ඉවත් නොකර තබාගැනීමෙන් එය වඩාත් පැහැදිලිවේ. බ්‍රිතාන්‍ය ආධිපත්‍ය ගොඩනැගූ මුල් අවධියේ මෙම ඒකාධිකාරී ආර්ථික රටාව පවත්වාගෙන යනු ලැබුවද 1833 කෝල්බෲක් ප්‍රතිසංස්කරණය සමග වෙළඳපොළ ආර්ථිකයක බිහිවීමට ඇති බාධා පෙන්වා ඒවා ඉවත් කිරීමට පියවර ගත්තේය.

යටත්විජිත රාජ්‍ය තුළ බ්‍රිතාන්‍ය බලය ගොඩනැගීමේදී මෙරට දේශපාලන බලයද හිමිකර ගැනීම වැදගත් විය. ඒ සඳහා ඇඩම් ස්මිත්, ජේම්ස් මිල්ස් වැනි අය පෙන්වාදෙන්නේ ආඥාදායක පාලන ක්‍රමය යෝග්‍ය බවකි. එයට හේතුවන්නේ මෙපමණ කල් මෙම රටවල් ඍජු පාලන ක්‍රමයන්ට හුරුවී සිටියේය. රජු යටතේ සිට පහළ ශ්‍රේණිය දක්වා ව්‍යාප්තවූ නිලබල ක්‍රමයක් තිබුණි. මෙම පාලන ක්‍රමය යම්කිසි සම්ප්‍රදායක් මත ගොඩනැගුණි. එසේම බ්‍රිතාන්‍ය මව් රජය ලබා තිබූ අත්දැකීම්ද ඉතා වැදගත්වේ. එනම් නියෝජිත පාලන ක්‍රමයක් ඇමරිකානු යටත්විජිතවල පැවති අතර එය ඔවුන්ට නිදහස කරා ගමන් කිරීමට හේතුවිය. එනිසා අධිරාජ්‍යවාදී පාලනයට හානියක් නොවන අයුරින් පාලන ප්‍රතිපත්ති සකස් කළේය. මෙම තර්කය ඉදිරිපත් කිරීමේදී ඔවුන් පවසන්නේ යටත්විජිත රාජ්‍ය බලය ක්‍රියාත්මක වීමේදී බිහිවන යටත්විජිතයේ ප්‍රධාන ලක්ෂණය වන්නේ ආණ්ඩුකාර වරයාගේ ආඥාවාදී පාලන ක්‍රමයක් බිහිවීමයි. 1833 දක්වා පැවතුනේ මෙවැනි පාලන ක්‍රමයකි. හෙන්රි ඩන්ඩාස්ගේ නිර්දේශ දෙස සියුම්ව බලන විට පෙනීයන කාරණයක් වන්නේ යුරෝපා සමාජය සමග සැසඳීමේදී ලංකා සමාජය පහත් බවත්, ඔවුන් ශිෂ්ඨත්වය කරා ගෙනයෑම මූලික යුතුකම ලෙස සලකන ලදි. මෙය සුදු මිනිසාගේ කර්තව්‍ය ලෙස පෙන්වා දුන්නේය. නමුත් මෙම උපදේශ තුළින් පැහැදිලි වන්නේ සමාජ ශිෂ්ඨත්වය කරා ගෙනයාමටත්, වෙළඳපොල දියුණුකර, කාර්යක්ෂම ආර්ථිකයක් ගොඩනගා බ්‍රිතාන්‍යයේ අභිවෘද්ධිය ඇති කිරීමයි.

ඔවුන් අපේක්ෂා කළ මෙම රාජ්‍ය බලය ගොඩනැගීමේදී ආයතනික ව්‍යුහයක් ගොඩනැගීම අවශ්‍යවේ. මෙහි ප්‍රධාන ලක්ෂණය වන්නේ නිලබල වාදය ගොඩනැගීමයි. ඒ අනුව ආණ්ඩුකරුගේ සිට පහළ නිළධාරීන් දක්වා මණ්ඩලයක් විය. මෙහිදී රජයේ ඉහළ තනතුරු සියල්ල යුරෝපීයයන්ට හිමිවූ අතර පහළ ගම්මුලාදෑනි තනතුරු ස්වදේශිකයන් සතුවිය. බ්‍රිතාන්‍ය බලය ගොඩනැගූ 1798 වැනි වකවාණු වලදී සිවිල් තනතුරු අද්මිරාල්වරුන්ට හිමි වුවත් 1798 ඇතිවූ කැරැල්ල සමග අහෝසි විය. ඒ අනුව ඩන්ඩාස් යෝජනා වල පවා මෙරට සිවිල් සේවාව පිහිටුවීම සඳහා විදෙශිකයන් යෝජනා කළ අතර ප්‍රධාන නගරයෙන් පිටත පදිංචිවීමට ඔවුන්ට අවසර ලැබුනේ නැත. ඔවුන් අවුරුදු 50ක සේවාවෙන් පසු මව් රටට යායුතුය. නමුත් මෙම සිවිල් සේවකයින් දේශීය සමාජයට අනුගත කිරීමේදී නොයෙක් අපහසුතාවයන් ඇතිවිය. එයට

හේතුව වන්නේ දේශීය සමාජය ගැන ඔවුන් ලබාතිබූ අත්දැකීම් අඩුකමයි. නමුත් එය ඉස්මතුවීමට ඉඩනොදී බ්‍රිතාන්‍යයන් ලංකාවට පැමිණියේය. එසේ ඔවුන් පැමිණියේ මෙරට සමාජ සුභසිද්ධිය උදෙසා බව පෙන්වා දී තිබේ. මෙම සිවිල් සේවක පන්තිය යුරෝපීය බුද්ධිවාදයට හසුවී විශ්වවිද්‍යාල අධ්‍යාපනය හදාරා පැමිණි අයයි. එමනිසා ඔවුන්ගේ සිත් තුළ මෙම මතවාද එල්බගෙන තිබුණි. ඔවුන් විසින් කළ නිර්දේශ වලත්, ලියන ලද පොත්පත් වලත් කිසිඳු අවස්ථාවක මෙම සමාජවල යටත්විජිත ආධිපත්‍ය ගැන කථා කළේ නැත. පීතෘ පාලන ක්‍රමයක් ගැන මෙහිදී පෙන්වාදී ඇත. එනම් පියෙකු විසින් දරුවන් බලාගන්නා සංකල්පයක් පෙන්වීමට උත්සහ ගෙන ඇත. නමුත් එය ක්‍රියාත්මක වීමේදී එසේ නොවූ බව1818, 1848, 1915 ඇතිවූ කැරලි මර්දනයට බ්‍රිතාන්‍යයෙන් ගනුලැබූ ප්‍රතිපත්ති තුළින් පැහැදිළිවේ. ප්‍රධාන වශයෙන් පාලකයින් පමණක් නොව මිෂනාරීන්, (ස්පේන්සර් හාඩි) වතු හිමියන් ආදී නොයෙක් අය තම තමන්ගේ කාර්යය ඉටු කිරීමේදී ඔවුන්ගේ මව් රට බලාපොරොත්තුවූ සේවය, යටත්විජිත ආධිපත්‍යට පටහැනි නොවන ආකාරයට ක්‍රියාකොට ඇති බව පෙනේ.

ඉහතින් පෙන්වා දුන් ආකාරයට යටත්විජිතවාදය යන සංකල්පය තුළ ලංකාවේ යටත්විජිත රාජ්‍ය ඊ මුරකරුවකුගේ ස්වභාවය ගන්නා බව පෙන්වීමට කදිම උදාහරණයක් 1833 ඇතිකළ ප්‍රතිසංස්කරණය මගින් පැහැදිලිවේ. විශේෂයෙන්ම කෝල්බෲක් කොමිසම ලංකාවට පැමිණියේ ආදායම් වියදම් ප්‍රශ්න හා තවත් හේතු පදනම් කරගෙනයි. මෙකල ලංකාවේ සිවිල් සේවාවේ පැවති දූර්වලතා හේතුවෙන් එය මගහරවා ගැනීම පිණිස මෙරට සමාජයේ ඉංග්‍රීසි භාෂාව මූල්කරගත් අධ්‍යාපන ක්‍රමයක් සහිත සිවිල් සේවයක් ස්ථාපිත කරන ලදි. ඒ අනුව මෙරට ජන සමාජය වෙනස්වීමකට භාජනය විය. මව් රාජ්‍යට ගොස් කේම්බ්‍රිජ්, ඔක්ස්පර්ඩ් වැනි විශ්වවිද්‍යාල වල අධ්‍යාපනය හදාරා මෙරට සිවිල් සේවාවේ වර්දනයට මහත් පිටුවහලක් වූ බව පෙනේ. ඒ අනුව යටත්විජිත රාජ්‍යයේ ඊ මුරකරුවාගේ සංකල්පය වඩාත් කැපී පෙනෙන්නට විය. දේශීය සමාජය දියුණු වන ගමන් මව් රාජ්‍යයේ අපේක්ෂාවන්ද සපුරා ගැනීමට හැකිවිය. නමුත් සිවිල් සේවාව මෙරට ආරම්භ කළත් ඉන් නියම ප්‍රයෝජන සමස්ථ ජනතාවට හිමි වූවාද යන්න ගැටළුවකි.

මෙසේ සිවිල් සේවාවේ වර්ධනය සමග ඔවුන් පමණක් නොව වතු හිමියන්ද, නිලධාරීන්ද බ්‍රිතාන්‍ය ආධිපත්‍යට හානියක් නොවන ආකාරයට අධිරාජ්‍යවාදය ආරක්ෂා කරන අරමුණින් ක්‍රියා කර තිබේ. නමුත් මෙහිදී ඇතිවන ගැටළුවක් වන්නේ බ්‍රිතාන්‍ය ආධිපත්‍ය ආරක්ෂාවන ආකාරයෙන් කටයුතු කරන්නේ කෙසේද යන්නයි. ප්‍රධාන වශයෙන් 19 වන සියවසේ මෙරට ජනතාව විශාල ලෙස පීඩාවට පත්වූහ. ඔවුන්ට ඉඩම් හා ජලය පවා නැතිවූ බව පෙනේ. ප්‍රධාන වශයෙන් මෙම කාලයේ උඩරට ප්‍රදේශ කේන්ද්‍ර කර ගනිමින් වතු වගාවන් ආරම්භ විය. 1840 ඇතිවූ මුඩුබිම් පනත්, ධාන්‍ය පනත්, දේවාලගම් පනත් නිසා ජන සමාජයේ ගැටලු උද්ගත විය. වතු වගාව සඳහා ඉහළ භූමි යෝග්‍ය වූ බැවින් කැළෑ එළිපෙහෙළි කළේය. කැළෑ එළිකිරීමත් සමග පහත පැවතුනු ඉඩම් වලට ජලය නොලැබුණු අතර වැසි කාලයේදී සෝදා පාළුවට ලක්වී පහත් බිම් නිසරු විය. ඒ මගින් මිනිසුන්ගේ බෝග වගාවන්ද පාළු වූවාය. මේ තුළින් ජන සමාජය බිඳවැටේ. ඉන් ගම්‍ය වන්නේ 19 වන සියවසේ ජන සමාජයේ නොයෙකුත් ප්‍රශ්න ඇතිවන අතර ඒ සඳහා කිසිඳු පිළියමක් යටත් විජිත පාලකයන් විසින් ලබාදෙන්නේ නැති බවයි. ඊ මුරකරුවාගේ රාජ්‍ය ක්‍රමය ප්‍රායෝගික නොවන බව මෙයින් ප්‍රත්‍යක්ෂවේ. ජන සමාජය හා යටත්විජිත පාලනය අතර විශාල පරතරයක් වර්ධනය වන බව මෙයින් පැහැදිලිවේ. බොහෝ විට දෙපිරිස අතර අසමානතාවයක් දක්නට ඇත. සුදුමිනිසාගේ කර්තව්‍ය යන අදහස කොතෙක් දුරට මේ තුළ සාධාරණීකරණය කළ හැක්කේ කෙසේද යන්න ගැටළුවකි.

මූලික වශයෙන් බ්‍රිතාන්‍ය යටත්විජිත රාජ්‍ය තුළ මනා කාර්යක්ෂම පාලන ක්‍රමයක් බිහිකර තිබේ. ඒ තුළින් බ්‍රිතාන්‍ය ආධිපත්‍ය ස්ථාපිත වන අතර නීතිය සහ සාමයද ආරක්ෂා කිරිමට නොහැකිවූ බව පෙනේ. නීතිය හා සාමය ආරක්ෂා කිරීමේදී කොතෙක් දුරට කවර පිළිවෙතක් අනුගමනය කළ යුතුද යන්න ගැටළුවකි. එසේ ගොඩනගනු ලබන පිළිවෙත තුළ ආර්ථික වර්ධනයට අවශ්‍ය බඳු පිළිවෙතහි නව ක්‍රියාදාමයක් ඇති කරන ලදි. ආර්ථික වර්ධනයට අවශ්‍ය යටිතල පහසුකම් මෙරට ආරම්භ කළ බව පෙනේ. වතු ආර්ථිකයක් මෙරට ස්ථාපිත කොට කර්මාන්ත, දුම්රිය, මාර්ග සහ වරායන් යන සේවාවන්ගේ වර්ධනයක් මෙම වකවානුවේ ඇති වූහ.

ලංකා යටත්විජිත රාජ්‍ය තුළ බලය ගොඩනැගීමේදී ක්‍රමවත් ආකාරයට එය සිදුකළේය. දේශිය මුලාදෑනින්, උඩරට ප්‍රභූන්ගේ අයිතිවාසිකම් සහ වගකීම් ආරක්ෂා කරමින් 1815 ලබාදුන් පොරොන්දු වල නැවත වෙනස් වීමක් 1818දී ඇති වූවාය. එහිදී ප්‍රධාන වශයෙන් 1833 වන විට දේශිය ප්‍රභූ පන්තිය සතුව පැවති බලතල ක්‍රමයෙන් අඩුකොට සිවිල් සේවකයන් සඳහා ලබාදී ඇත. මෙම ක්‍රියාවලිය ලංකාවේ පමණක් නොව අප්‍රිකාවේ ගෝත්‍රික නායකයින් මගින්ද ඉන්දියවේ මහරාජාවරුන්ගේ සහයෝගයෙන් පාලනය කරන ලදි. මෙසේ දේශිය ප්‍රභූ පිරිස්ගෙන් ලත් සහයෝගය නිසා දේශපාලන ක්ෂේත්‍රයේ ඇතිවන ගැටුම් සමනය කිරීමට හැකිවිය. ඒ තුළ ඊ මුරකරුවාගේ කර්තව්‍ය නමැති සංකල්පය වඩාත් කැපී පෙනේ.

දේශපාලන වශයෙන් යටත්විජිත රාජ්‍ය තුළ බ්‍රිතාන්‍ය ක්‍රියාකාරීත්වය ගෙනහැර බලන විට වතු ව්‍යාපාරයට අවශ්‍ය ආරක්ෂාව සළසා දීමට නොයෙක් ආකාරයේ කටයුතු යෙදුවේය. වතු කටයුතු දියුණු කිරීමට අවශ්‍ය පසුබම සකසන අතර දේශිය සමාජයේ ඇතුළු ශ්‍රම වෙළඳපොලෙහි හිඟය පියවීම සඳහා දකුණු ඉන්දියානු කම්කරුවන්ගේ ආදේශයක ද සිදුවිය. වතු හිමියන් සමාජයේ ප්‍රභූ පිරිසක් ලෙස සළකා ඔවුන්ට ඉතා වැදගත් තැනක් දීමට ක්‍රියාකර ඇත. මෙරට නීතිය මගින්ද ඔවුන්ගේ රැකවරණයට කටයුතු කරනු ලැබීය. එවිට ධනය හිමි පන්තිය ආරක්ෂාවන අතර දේශීය සමාජයටද ඉන් රැකවරණය ලැබුණි. නමුත් දේශීය සමාජයේ උද්ගතවූ ශ්‍රම හිඟයට දකුණු ඉන්දීය කම්කරුවන් ආදේශ කර ඇතිකළ පසුබිම මගින් ඊ මුරකරුවාගේ සංකල්පය කොතෙක් දුරට සාර්ථක වූවාද යන්න ගැටළුවක් බව පෙනේ. එසේ පැවසීමට හේතු වූයේ දේශීය ඉඩම් අඩු මිලකට ලබාගත් බැවින් සමාජයේ ප්‍රශ්න උද්ගත වූවාය. එයට පිළියම් යෙදීමෙන් තොරව කළ ශ්‍රම ආදේශනය තවදුරටත් ගැටුම් ඉස්මතු වීමට හේතුවූ බව පෙනේ.

යටත්විජිත රාජ්‍යයක් ලෙස ලංකාවේ පාලන ව්‍යුහය තුළින් ආර්ථිකය ගොඩනැගීමේදී ආවශ්‍ය මුදල් සපුරාගෙන ඇත්තේ දේශීය සමාජය කේන්ද්‍ර කරගෙනය. යුධ හමුදාව නඩත්තුව සහ අනෙකුත් පරිපාලන කටයුතු සඳහා යටත්විජිත කාර්යාලයේ අනුමැතිය ඇතිව ආදායම් වියදම්කර අතිරික්තය මව් රජයට යවන ලදි. බොහෝ දුරට බ්‍රිතාන්‍ය රජය ලංකාව කෙරෙහි දැක්වූ

ආකල්පයේ අරමුණ වූයේ ලංකාවේ පැවති නිෂ්පාදන රාමුවක් තුළට ආර්ථික දුරාවලියක් බිහි කිරීමයි. අතීතයේ සිට කෘෂිකාර්මික ආර්ථික රටාවක් පැවති නිසා එය ඇති කළ හැක්කේ කෘෂිකාර්මාන්තය පදනම් කරගෙනයි. දේශීය සමාජයේ මෙම වගා කටයුතු නිසා අතිරික්තයක් දක්නට ලැබුණි. නමුත් ලන්දේසි හා පෘතුගීසි අවධිවලදී දේශීය කර්මාන්තයට තදබල ලෙස පහර වැදිණි. මෙසේ ගරා වැටුනු ආර්ථිකය ගොඩනැගීමට නම් වාරිමාර්ග වැව් අමුණු දියුණු කිරීම අවශ්‍ය බව පිළිගත්තේය. නමුත් බ්‍රිතාන්‍ය පාලකයෝ ඒ පිළිබඳ එතරම් උනන්දු නොවී වාණිජ භෝග වගාවන් කෙරෙහි මුල්තැන ලබාදීමට පියවර ගනී. මෙතෙක් විදේශීය වශයෙන් ඉන්දියාව මුල්කරගෙන පැවති වෙළඳාමට පහර වදින අතර ඒ වෙනුවට යුරෝපයෙන් ගෙන්වූ භාණ්ඩවලට මෙරට සමාජය හුරු කරනු ලබයි. එයින් ආර්ථිකයේ මෙතෙක් පැවති අතිරික්තය ක්‍රමයෙන් අඩුවන ආකාරය දක්නට ලැබේ. වාණිජ භෝග වගාවන් සමග දේශීය සමාජයේ මෙතෙක් පැවති ස්වයංපෝෂිතභාවය බිඳවැටී වාණිජවාදී ආර්ථිකය ක්‍රියාත්මක විය. එය 1833 පමණ වන තෙක් පැවති අතර ඉන්පසු වෙළඳපොල ආර්ථිකයක් වර්ධනය වීමට පසුබිම සැකසේ.

මේ ආකාරයට යටත්විජිත රාජ්‍ය සංකල්පය තුළ බ්‍රිතාන්‍යයන් ලංකාවේ අනුගමනය කල ප්‍රතිපත්තියේ දේශපාලන හා ආර්ථික අංශයන් පමණක් නොව සමාජ හා සංස්කෘතික අතින්ද වෙනස්කම් දක්නට ලැබේ. යුරෝපීය බුද්ධිවාදයෙන් වර්ධනයවූ සමාජ සංස්කෘතික ලක්ෂණ දේශීය සමාජයට මුසුවී වෙනත් සමාජ තත්වයක් ගොඩනැගේ. සාම්ප්‍රදායික කුල ක්‍රමය මත පදනම සැකසුන මෙරට සමාජයේ නොයෙක් දුර්වලතා භාවිතා කරමින් ඔවුන්ගේ අහිතකර පිළිවෙත්ද මෙරට සමාජයට සංයෝජනය කරනු ලැබීය. ඒ අනුව උගත් මධ්‍යම පන්තියක් බිහිවන අතර ඔවුන් තුළින් ඇතිවන ප්‍රබෝධය ලංකාව නිදහස කරා යන ගමනේ ඉතා වැදගත් කාර්ය භාර්යක් ඉටු කළහ. මේ අනුව ඊ. මුරකරුවාගේ සංකල්පය තුළත් යටත් විජිත රාජ්‍ය ක්‍රමයේ දේශීය සමාජය නොයෙක් දුෂ්කරතා මධ්‍යයේ වුවද ඉතා වැදගත් පිරිසක් ලෙස ඉදිරියට එති.

අප ඉහතින් සාකච්ඡා කරන ලද තොරතුරු වලට අනුව පෙනීයන්නේ බ්‍රිතානය යටත්විජිත රාජ්‍ය ක්‍රමය සාධාරණීකරණය කිරීම සඳහා ඔවුන් යොදාගත් තර්කය වූයේ ඊ. මුරකරුවාගේ ස්වභාවයක් ගත් බවකි. නමුත් එය

යටත්විජිතවාදය සාධාරණය කිරීමට බ්‍රිතාන්‍යයන් යොදාගත් මතවාදයක් පමණි. දේශීය ජනතාවගේ දේශපාලන, ආර්ථික සහ සමාජ අයිතිවාසිකම් මව් රජයේ අවශ්‍යතා මත කැප කිරීම නිසා රටෙහි සංවර්ධනය පසුබෑමට ලක්විය. එබැවින් ඒ. මුරකරුවාගේ කර්තව්‍ය බ්‍රිතාන්‍ය රජය නිසියාකාරයෙන් ඉටුකළේ නැත. එහි අසාර්ථක භාවයන් මෙරට බ්‍රිතානය පාලනය පුරාම දක්නට ලැබේ.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


01. ස්ටුවර්ට් සී. ඊස්ටන්, බටහිර යටත්විජිතවාදයේ නැගීම සහ වැටීම, රත්න පොත් ප්‍රකාශකයෝ, කොළඹ, 1967

02. අනුත්තරාදේවී. විද්‍යාලංකාර, යටත්විජිතවාදය, අධිරාජ්‍යවාදය සහ නව යටත්විජිතවාදය. ප්‍රියසිරි ප්‍රින්ටර්ස්, නුගේගොඩ. 2000

03. දයාන් ජයතිලක, යටත්විජිතවාදය සහ පරාධීන ධනවාදයේ වර්ධනය, කම්කරු ගොවි ආයතනය, 1990

04. බෘමෙන්ට්ස්. කරෙන්. නව යටත්විජිතවාදයේ හරය සහ විධි, ප්‍රගති ප්‍රකාශන 1989

05. නව අධිරාජ්‍යවාදය සහ තෙවන ලෝකය, මාර්ග ප්‍රකාශන 1974